කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

# බුද්ධ ධර්මය
(I කොටස)

10 වන ශ්‍රේණිය

පාසල ..........................................................

නම/ විභාග අංකය ..........................................................

පැය 01
One hour

* සැලකිය යුතුයි :- බහුවරණ ප්‍රශ්න 40 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් පිළිතුරකටලකුණු 1 බැගින් මුළු ලකුණු 40 කි.

---

(01) පුද්ගලයෙකු තම ජීවිත කාලයේදී නිරන්තරයෙන් කායික හා මානසික වෙනස්වීම්වලට භාජනය වේ. මෙම වෙනස්වීම් ස්භාවය බුදු දහමේ ඉගැන්වෙන්නේ,
(i) දුක්ඛ ලක්ෂණය (ii) අනිත්‍ය ලක්ෂණය
(iii) අනාත්ම ලක්ෂණය (iv) අවිතථ ලක්ෂණය

(02) අන්තගාමී පිළිවෙත් නිසරු බව පෙන්වා සමාජයේ යහපත උදෙසා බුදුන් වහන්සේ ගත් පියවර වූයේ,
(i) කාන්තාවට පැවිදිවීමට අවසර දීමය. (ii) මැදුම් පිළිවෙතට ජනතාව යොමු කිරීමය.
(iii) පංච ශීලයෙහි යොමු කිරීමය. (iv) සදිසාවන් නමස්කාර කිරීමය.

(03) නිර්වාණාවබෝධය සඳහාම ඉවහල් වන භාවනාව ලෙස බුදුදහමේ හැඳින්වෙන්නේ,
(i) මෛත්‍රී භාවනාව (ii) සමථ භාවනාව
(iii) විදර්ශනා භාවනාව (iv) ආනාපාන සති භාවනාව.

(04) බෝ සතුන් උප්පතිය ලබන විට ලෝක ධාතුව කම්පාවීම වැනි කරුණු අද්භූතසේ පෙනුණ ද එය සිදුවන්නේ කිසිවකුගේ මෙහෙය වීමකින් නොව ස්වාභාවික ලෙසමය. මෙය නියාම ධර්මය බුදුදහමට අනුව,
(i) උතු නියාම වේ. (ii) ධම්ම නියාම වේ.
(iii) චිත්ත නියාම වේ. (iv) බීජ නියාම වේ.

(05) ක්‍රි.පූ. 6 සියවසේ කොසොල් රට ශාක්‍ය ජනපදයේ ප්‍රධාන පාලකයා වූයේ,
(i) බිම්බිසාර රජතුමාය. (ii) සුද්ධෝදන රජතුමාය.
(iii) කොසොල් රජතුමාය. (iv) අජාසත්ත රජතුමාය.

(06) බුදුන්වහන්සේ සත්සතියක් ඇසතු බෝ මැඩ අවට විමුක්ති සුවයෙන් කල්ගත කළහ. බුදුන් වහන්සේ දෙවෙනි සතියෙන් ලොවට පෙන්වා දුන් ආදර්ශය වූයේ,
(i) කළගුණ සැලකීමය. (ii) ඉවසීම ය.
(iii) කරුණාවය. (iv) ලද දෙයින් සතුටුවීමය.

(07) ස්වාමීණි, ඔබ දෙවියෙක්ද? ගාන්ධර්වයෙක්ද?, යක්ෂයෙක්ද නැතහොත් මනුෂ්‍යයෙක්ද යනුවෙන් බුදුන්වහන්සේගෙන් විමසුබමුණා වූයේ,
(i) තෝදෙය්‍ය බමුණාය. (ii) උපතිස්ස බමුණාය.
(iii) ද්‍රෝණ බමුණාය. (iv) සෝණදණ්ඩ බමුණාය.

08) මහා සංඝ රත්නය ''දක්ඛිණෙය්‍ය' වනුයේ,
   (i) ආර්ය අෂ්ටාගික මාර්ගය අනුගමනය කරන නිසාය.
   (ii) ආගන්තුකයන් සඳහා සූදානම් කළ ආහාර පිළිගැනීමට සුදුසු නිසාය.
   (iii) දොහොත් මුදුන් දී නමස්කාරයට සුදුසු නිසාය.
   (iv) පරලොව සුවපතා දෙන දානයට සුදුසු නිසාය.

(09) දුටුගැමුණු රජතුමා මිරිස් ආහාරයක් සඟනට පූජා කිරීමට අමතකව ආහාරයට ගැනීම නිසා තමාටම දඬුවම් දෙනු පිණිස සැදූ චෛත්‍යය වූයේ
   (i) මිරිස වැටිය (ii) රුවන් වැලි මහා සෑය
   (iii) ථූපාරාමය (iv) අභයගිරිය

(10) නිමල් පොඩි ගැටලුවකදී පවා කෝපවන ශිෂ්‍යයෙකි. මෙවැනි සිසු දරුවකුට කෝපය නිවීමට සුදුසු වන භාවනාව වන්නේ,
   (i) බුදු ගුණ භාවනාවයි. (ii) මෛත්‍රී භාවනාවයි.
   (iii) විදර්ශනා භාවනාවයි. (iv) ආනාපාන සති භාවනාවයි

(11) තෙරුවන් පිළිබඳ කරුණු දැනීමෙන් ඇතිවන ප්‍රසාදය බුදුදහමේ හැඳින්වෙන්නේ,
   (i) බුද්ධ ප්‍රසාදය යනුවෙනි. (ii) ශ්‍රද්ධාව යනුවෙනි.
   (iii) අවේච්චප්පසාදය යනුවෙනි. (iv) ධම්මප්‍රසාදය යනුවෙනි.

(12) පිරිනිවන් පාන අවසන් අවස්ථාවේ බුදුන් වහන්සේ තමා සමීපයට ගෙන්වා දහම් දෙසා පැවිද්ද ලබාදුන් බුදු සසුනේ අන්තිම ශ්‍රාවකයා වූයේ
   (i) සුභද්ද භික්ෂුවය. (ii) උපාලි භික්ෂුවය.
   (iii) අනුරුද්ධ භික්ෂුවය. (iv) වජ්ජි පුත්‍රක භික්ෂුවය.

(13) නුවණැත්තන්ගෙන් දොස් ඇසීමට සිදුවන බව සලකා වරදින් වැළකීම බුදු දහමේ හැඳින්වෙන්නේ,
   (i) අත්තාධිපතෙය්‍ය නමිනි. (ii) ධම්මාධි පතෙය්‍ය නමිනි.
   (iii) ලෝකාධිපතෙය්‍ය නමිනි. (iv) ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය නමිනි.

(14) ''පවිත්‍ර ජලයෙන් පුළුල් ගල්තලාවෙන් වඳුරන් හා වෙනත් සිව්පාවුන්ගෙන් ද යුත් දිය සෙවලින් වැසුණු එම ගල්කුළ මා සිත ඇද ගනී'' මෙසේ ප්‍රකාශ කලේ,
   (i) පඤ්චසිඛ දිව්‍ය පුත්‍රයාය. (ii) සෝණ කුට්ටිකණ්ණ හිමිය.
   (iii) වනවච්ඡ හිමිය. (iv) කාළුදායි හිමිය.

(15) පවුල් ජීවිතයේ මූලික ඒකකය වන්නේ ස්වාමි භාර්යා සම්බන්ධතාවයි. බුදුන් වහන්සේ ඒ පිළිබඳව දක්වා ඇති සූත්‍රය වන්නේ,
   (i) පරාභව සූත්‍රය. (ii) මංගල සූත්‍රය
   (iii) වසල සූත්‍රය (iv) සිඟාලෝවාද සූත්‍රය

(16) අධික මාංශ පරිභෝජනය නිසා ඇතිවන රෝගයකි.
   (i) හෘදයාබාධ (ii) රූමැටික් උණ
   (iii) උණ සන්නිපාතය (iv) නිව්මෝණියාව

(17) සිව්වන ධර්ම සංගායනාව පැවැත්වූයේ,
   (i) බරණැස ඉසිපතනාරාමයේ දීය. (ii) පාඨලී නුවර අශෝකාරාමයේ දීය.
   (iii) අනුරාධපුරයේ මහාවිහාරයෙදීය. (iv) මාතලේ අළුවිහාරෙදීය.

(18) "මගේ ශරීරය රෝගී වූවත් සිත නිරෝගී විය යුතු යැයි" බුදුන්වහන්සේ ප්‍රකාශ කළේ,
(i) නකුල පීතාටය. (ii) ආනන්ද හිමියන්ටය.
(iii) අනේ පිඬු සිටුවරයාටය. (iv) බරණැස් සිටුවරයාටය.

(19) පියසෝම ගමේ ඌරන් මැරූ පුද්ගලයෙකි. ඔහු අධික ලෙස දුක් විඳ ඌරකුමෙන් කෑ ගසා මිය ගියේය. බුදු දහමට අනුව ඔහුට විපාක දුන් කර්මය වූයේ,
(i) අපරාපරියවේදනීය කර්මය (ii) උපපජ්ජ වේදනීය කර්මය
(iii) දිට්ඨධම්මවේදනීය කර්මය (iv) කටත්තා කර්මයයි.

(20) ඇමරිකාවේ වර්ජිනියා විශ්වවිද්‍යාලයේ සේවය කළ ඉයන් ස්ටීවන් මහතා තම පර්යේෂණ සඳහා යොදවා ගත්තේ,
(i) කර්මය විපාක පිළිබඳ වාර්ථාය. (ii) පුර්භවය පිළිබඳ වාර්ථාය.
(iii) කාම ලෝක පිළිබඳ වාර්ථාය. (iv) භූත බලවේග පිළිබඳ වාර්ථාය,

(21) කලාත්මක අතින් විශිෂ්ඨ අගනා සඳකඩ පහන පිහිටියේ.
(i) පොලොන්නරුවේ ගල් විහාරය අභියස (ii) අනුරාධ පුරයේ බිසෝ මාලිගයෙය.
(iii) මහනුවර දළදා මාලිගාව අභියස (iv) කැළණි රජමහා විහාර අභියසය.

(22) නිවන් අවබෝධ නොකල සත්වයන් සංසාරයේ කර්මානුරූපව උපදී, බුදුදහමට අනුව එසේ උපදන කාමලෝක ගණන,
(i) 12 කි. (ii) 11 කි. (iii) 16 කි. (iv) 5 කි.

(23) සිදුහත් කුමරු තම පියා, සුළු මව, අළුත උපන් රාහුල කුමරු යශෝදරා දේවිය හා සියළු සැප සම්පත් අත්හැර අභිනිෂ්ක්‍රමණය කළේ,
(i) ඇසළ පෝදිනය (ii) වෙසක් පෝ දිනයක.
(iii) පොසොන් පෝදිනය (iv) උඳුවප් පෝ දිනයක

(24) සිව්වනක් පිරිස ආධ්‍යාත්මික වශයෙන් උසස් මට්ටමකට දියුණුකර බුදුන්වහන්සේ පිරිණිවන් පෑවේ,
(i) අසූවන වියේදීය. (ii) අසූපස්වන වියේදීය.
(iii) හැට නවවන වියේදීය (iv) අසූ එක්වන වියේදීය.

(25) ඵුට්ඨස්ස ලෝක ධම්මෙහි - චිත්තං යස්සන කම්පති
අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං
යන්න සම්බන්ද කළ හැක්කේ
(i) කරුණාවටය (ii) මෛත්‍රියටය
(iii) අටලෝ දහමින් කම්පා නොවීමටය. (iv) දෙමව්පියන්ට සැලකීමටය.

(26) කරණීය මෙත්ත සූත්‍රයට අනුව පහසුවෙන් පෝෂණය කිරීම යනු
(i) නිපකෝයන්නය (ii) සුභරයන්නය
(iii) සක්කෝයන්නය (iv) සුවචයන්නය

(27) කය, වචනයේ නිවැරදි හැසිරීම,
(i) සමාධිය වේ. (ii)ප්‍රඥාව වේ. (iii) සීලය වේ. (iv) බ්‍රහ්ම විහරණ වේ.

(28) පන්සිය පනස් ජාතක පොත අයිතිවන්නේ,
(i) කෝට්ටේ යුගයටය (ii) කුරුණෑගල යුගයටය
(iii) මහනුවර යුගයටය (iv) සීතාවක යුගයටය

(29) බුදු පිළිමවල දහම් දෙසන බව සංකේතවත් කරන මුද්‍රාව වන්නේ,
(i) ධර්මචක්‍ර මුද්‍රාවය (ii) විතර්ක මුද්‍රාවය
(iii) අභය මුද්‍රාවය (iv) වරද මුද්‍රාවය

(30) වලගම්බා රජු අභය ගිරිය තනවා පෞද්ගලික පූජාවක් ලෙස පූජාකළේ
(i) මහා තිස්ස හිමියන්ටය. (ii) සුමංගල හිමියන්ටය.
(iii) රාහුල හිමියන්ටය. (iv) මිහිඳු හිමියන්ටය.

(31) ආර්යඅෂ්ඨාංගික මාර්ගයේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, අයත් වන්නේ,
(i) සීල (ii) සමාධි (iii) ප්‍රඥාව (iv) භාවනා.

(32) යශෝධරා දේවිය විසින් සසර පුරා තමන්වෙත දක්වන ලද සෙනෙහස අනුකූලතාවය අගය කළ බුදුන් වහන්සේ එතුමියට දේශනා කල ජාතක කථාව වූයේ,
(i) වෙස්සන්තර ජාතකය. (ii) සඳ කිඳුරු ජාතකය.
(iii) මහා ධර්මපාල ජාතකය (iv) සාම ජාතකය.

(33) සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අරහත් යන සතර මාර්ග හා සතර ඵල ලබාගත් උතුමාණෝ හැඳින්වූයේ,
(i) උපාසක ලෙසය. (ii) උපාසිකා ලෙසය.
(iii) අෂ්ට ආර්ය පුද්ගල මහා සංඝරත්නය ලෙසය. (iv) රහතන් වහන්සේලා ලෙසය.

(34) චතුරාර්ය සත්‍ය නොදැනීම බුදු දහමේ හඳුන්වන්නේ,
(i) සංඛාරලෙසය (ii) අවිද්‍යාවලෙසය
(iii) උපාදානලෙසය (iv) භවයලෙසය

(35) නිර්මලා රූමත් ගුණවත් දැරියකි. ඇගේ ශරීරය මෙතරම් රූමත් වූයේ,
(i) සංසාරයේ මෛත්‍රිය වැඩූ නිසාය. (ii) සංසාරයේ සතුන් නොමැරූ නිසාය.
(iii) සංසාරයේ කරුණාව දක් වූ නිසාය. (iv) උතුමන්ට ගරු කිරීම නිසාය.

(36) බිම්බිසාර රජතුමා විසින් බුදුන් වහන්සේට පූජාකල ප්‍රථම ආරාමය වූයේ,
(i) වේළුවනාරාමයයි (ii) ජේතවනාරාමයයි
(iii) ඉසිපතනාරාමයයි (iv) වාළුකාරාමයයි

(37) භාරතයේ බුදුපිළිම මුලින් නිර්මාණය කළේ,
(i) අශෝක රජු දවසය (ii) කනිෂ්ක රජු දවසය
(iii) චන්ද්‍ර ගුප්ත රජු දවසය (iv) බිම්බිසාර රජු දවසය

(38) අනුරාධපුරයුගයට අයත් ඉපැරණි පද්‍ය අපට ලැබෙන්නේ,
(i) සීගිරි කුරුටු ගීතිවළින් (ii) සැලලිහිණි සංදේශය තුළිනි.
(iii) ගිරා සංදේශය තුළිනි. (iv) මයුර සංදේශය තළිනි

(39) ත්‍රි ශික්ෂාව යනු,
(i) සීල, සමාධි, ප්‍රඥා. (ii) ජාති ජරා මරණ
(iii) ලොභ, ද්වේෂ, මෝහ (iv) ශ්‍රද්ධා, සීල, ත්‍යාග

(40) මුද්‍රාව හැඳින්වෙන්නේ,
(i) අභය (ii) විතර්ක (iii) ධර්මචක්‍ර. (iv) ධ්‍යාන

කොළඹ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2012

# බුද්ධ ධර්මය

(II කොටස )

10 වන ශ්‍රේණිය

පැය 02
Two hour

පාසල ..............................................................

නම/ විභාග අංකය ..............................................................

පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්නයකි එය කොටස් 10 කින් සමන්විත වේ එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි.

සෙසු ව්‍යුහගත ප්‍රශ්න 06 න් 04 කට පිළිතුරු සැපයිය යුතුය. එක් පිළිතුරකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 40 කි.

---

01) කෙටි පිළිතුරු සපයන්න.

(i) සිදුහත් තවුසා විසින් අත් හළ අන්ත දෙක නම් කරන්න.

(ii) ජේතවනාරාමය සහ පූර්වාරාමය බුදුන්වහන්සේට පූජා කළේ කවුරුන් විසින් ද?

(iii) කුසල චේතනා තුනක් ධර්මයෙහි ඉගැන්වේ. ඉන් දෙකක් ලියන්න.

(iv) විවිධ අරමුණු කරා ගමන් කරන සිත එක් අරමුණක පිහිටුවන බෞද්ධ භාවනා ක්‍රමය කුමක් ද?

(v) දුටුගැමුණු රජතුමා විසින් ඉදිකළ බෞද්ධ ස්ථූප දෙකක නම් ලියන්න.

(vi) බුදුරදුන් විසින් පෙන්වා දුන් ලෝවැස්සන්ගේ හැසිරීම පාලනය කරන ලෝකපාලක ධර්ම දෙක කුමක්ද?

(vii) පංච ශීලයේ සඳහන් පළමු හා පස්වෙනි ශික්ෂා පද දෙක කුමක්ද?

(viii) සිව්පසයෙන් දෙකක් නම් කරන්න.

(ix) ලෝකයෙහි කාලගුණික වෙනස්වීම් හා හොඳ නරක කර්මවලට හොඳ නරක විපාක ලැබීම කිනම් නියාම ධර්ම දෙකට අයත් වේද?

(x) ලෝවැඩ සඟරාවේ කතුවරයා වූයේ කවුරුන්ද? ලකුණු 02 බැගින් (10x2) 20

(02) "යමෙක් ධර්මය දකී ද හේ මා දකියි. මෙයින් අදහස් කළේ බුදුන්වහන්සේගේ ධර්මය තේරුම් ගැනීමයි. ලොව පවත්නා සත්වයා, වස්තූන්, නිරන්තරයෙන් වෙනස්වීමට භාජනය වේ.

(i) බුදු දහමේ මේ වෙනස්වීම හඳුන්වනු ලබන්නේ කිනම් නමකින් ද? ලකුණු (2)

(ii) බුදුන්වහන්සේ පෙන්වා දුන් අනාත්මවාදී සංකල්පය කෙටියෙන් හඳුන්වන්න. ලකුණු (3)

(iii) ලොව පවතින සියළු දේ වෙනස්වීමට භාජනය වන අයුරු පෙන්වා දීමෙන් ශිෂ්‍ය ජීවිතයේ අභියෝග ජයගත හැකි වන අයුරු පහදන්න. ලකුණු (5)

(03) ශ්‍රේෂ්ඨ චරිතයක් පිළිබඳව දැනගැනීමේ පරමාර්ථය වන්නේ එමඟින් ශිෂ්‍යයන් වන අපගේ ජීවිතයද ශ්‍රේෂ්ඨත්වයට පත්කර ගැනීමය. එම උදාර පරමාර්ථය සඳහා අප විසින් බුද්ධ චරිතය හැදෑරිය යුතුය.

(i) බුදු සිරිතෙන් අපේ දිවියට ලබා ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ල. 02 යි.)

(ii) ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03 යි.)

(iii) සදාචාර සම්පන්න සිසු දරුවෙකු ලෙස ගත කිරීමට මෙම ආදර්ශ කොතෙක් දුරට උපකාරී වේද? (ල. 05 යි.)

(04) නව විවාහ දිවියක් ගත කිරීම සඳහා තරුණ යුවලකගේ යුග දිවියට බුදුන් වහන්සේ දේශනා කලා වූ සිඟාලෝවාද සූත්‍රය උපකාරී විය.

(i) මෙම සූත්‍රයට අනුව ස්වාමි භාර්යා අයත් වූයේ කිනම් දිසාවට ද? (ල. 02 යි.)

(ii) ස්වාමියා විසින් තම ආදරණීය භාර්යාවට ඉටු කළ යුතු යුතුකම් තුනක් සිඟාලෝවා ද සූත්‍රයට අනුව දක්වන්න.

(iii) චතු සංවාස සූත්‍රයට අනුව දිව්‍ය පුත්‍රයෙක් දෙව් දුවක් හා එකට විසීම යන බෞද්ධ අර්ථය තුලින් යහපත් පවුල් ජීවිතයක් ගත කරන අයුරු පහදන්න.

(05) (i) සංගායනාවක් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද? (ල. 02 යි.)

(ii) පළවෙනි, දෙවෙනි, තුන්වෙනි ධර්ම සංගායනා පැවැත් වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් කිනම් කාලයේද? (ල. 02 යි.)

(iii) බෞද්ධ සංගායනා තුළින් ධර්මය හා විනය ආරක්ෂා වූ අයුරු පහදන්න. (ල. 02 යි.)

(06) වෙසක් පෝ දින සිල් සමාදන් වූ පාසැල් ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් අමතා ධර්ම දේශනාවක් ඉදිරිපත් කළ ගරුතර ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළේ "මිනිසා පරිසරය හා බැඳී පවතී. පරිසරයෙන් තොරව කිසිම සත්වයෙකුට මිහිපිට ජීවත්විය නොහැක. බුදුන්වහන්සේ පරිසරය හා ස්වභාව සෞන්දර්ය අගය කල ශාස්තෘවරයෙකි.

(i) බුදුන් වහන්සේ සුන්දර වූ පරිසරය අගය කළ අවස්ථා දෙකක් පෙන්වා දෙන්න. (ල. 02 යි.)

(ii) අත්තූපනායක ධර්මය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න. (ල. 02 යි.)

(iii) පරිසරය ආරක්ෂා කිරීමෙන් නිරෝගීකම ඇතිවන අයුරු පහදන්න. (ල. 02 යි.)

(07) සිත යහපත් අරමුණක පිහිටුවාගෙන සිත හා ප්‍රඥාව වැඩීම භාවනාව ලෙස හඳුන්වයි.

(i) බෞද්ධ භාවනාව කොටස් දෙකකි. එය නම් කරන්න. (ල. 02 යි.)

(ii) සිත සංවර කිරීමට බාධා පමුණුවන පංචනීවරණ ධර්මවලින් තුනක් දක්වන්න. (ල. 02 යි.)

(iii) විසිරී ගිය සිත සංවර කර ගැනීමෙන් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන මානසික හා කායික සුවය කවරේදැයි විස්තර කරන්න. (ල. 02 යි.)